# සිංහල

## 5 ශ්‍රේණිය





Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# 9 පාඩම

## ඇ /ඇය යෙදුණු වැකි ලියමු.

පියවර 1

- **අපි දැන් පහත සඳහන් ඡේදය කියවමු.**

**මගේ යෙහෙළිය**

මගේ යෙහෙළියගේ නම කාවින්දි චතුරිකා යි. ඇ බොහෝ බුද්ධිමත්ය. ඇ දිනපතා ම පාසල් ගියා ය. ඇය පාසල් වැඩ හොඳින් සිදු කළා ය. ඇය නොදන්නා යමක් වෙතොත් ඒ පිළිබඳ ව විමසා දැන ගත්තා ය. ඇය බොහෝ පොත් පත් කියවූවා ය . කියවන අතර විශේෂ යමක් වෙතොත් ඇය ඒවා සටහන් තබා ගත්තා ය. ඒ සඳහා ඇය විශේෂ සටහන් පොතක් භාවිත කළා ය.

ඇය පාසල් විවේක කාලයේ දී පිට්ටනියට ගොස් සෙල්ලම් කළා ය. කාවින්දි වොලිබෝල් ක්‍රීඩා කිරීමට බෙහෙවින් ප්‍රිය කළා ය. එමෙන් ම ඇය පාසල් පුස්තකාලයේ නිත්‍ය සාමාජිකාවක් ද වූවා ය. පුස්තකාලයේ ඇති සෑම පොතක් ම පාහේ ඇය කියවා ඇති බව පැවසුවා ය.

ඇය හොඳින් අධ්‍යාපනය ලබා රටට වැඩදායී සේවයක් ඉටු කරන බව පැවසුවා ය.

**( ගුරු මාගෝප්දේශ සංග්‍රහයෙන් උපුටා ගන්නා ලදි.)**

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක

## පියවර 2

- ඔබ කිය වූ ඡේදයේ "මගේ යෙහෙළිය" යන උක්ත පදය වෙනුවට ඈ, ඇය යන වචන යොදා ඇති බව ඔබ හඳුනා ගත්තා ද? එසේ නම් අපි එම වැකි පහත පුවරුවල ලියමු.

1.

2.

3.

4.

5.

6.

7.

8.

9.

10.